# 22 ස්වාමිවාක් ආරාධනාව



11.1 රූපය - ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් සමග

පහත ගීතිකාව ගායනා කරන්න. (කැසට් පටයක් ආධාර කර ගන්නේ නම්, නිවැරදි තාලය අනුව ගායනා කළ හැකි ය.)

ත්‍රි එක සුර ජේසුනේ //
පරමණ්ඩලවල වැඩ සිටිනා
දෙව් පිතුරුගෙ දකුණේ
ආරාධිත වේවා ඔබෙ නාමය //
එනු ලද්දේවා ඔබෙ දිව්‍ය රාජ්‍යය//

වේවා ඔබෙ අභිමත සුරභූමි ලොව
දේවා නිරතුරු භෝජන අප හට
අපෙ ණයකරු හට අප ගෙවනා ලෙස//
අප ණයකරු අප හට ගෙවනුය තොස//

යක්ෂ වින මායම්වල අප නොවැටෙන ලෙස//
අප රැක ගලවනු ආමෙන් ජේසු//

(කිතුනු ගී අංක 304)

සැම වචනයක ම අරුත මෙනෙහි කරමින් නැවත ගායනා කරන්න. ගායනය දෙවරක් යැදුමකි. එම අත්දැකීමට ඇතුළු වන්න.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙම ගීතිකාව රචනා කර ඇත්තේ, ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ය. එයින් කියවෙන්නේ ස්වාමිවාක් ආරාධනාව යි. දෙව් මිනිස් සංවාදය සඳහා කිතු සමිඳුන් අපට ලබා දුන් පූර්වාදර්ශය ස්වාමිවාක් ආරාධනාව ය. ස්වාමිවාක් ආරධනාව නොහොත් පරමණ්ඩලය අපට ලැබුණ ආකාරය පිළිබඳ ව ශුද්ධ ලියවිල්ල අපට උගන්වයි:

> උන් වහන්සේ එක් තැනක යාච්ඤා කරමින් සිටි සේක. එය නිම වූ පසු උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් එක් තැනැත්තෙක් කතා කොට, "ස්වාමීනි, ජොහන් තම ගෝලයන්ට ඉගැන්වූ ලෙස, අපටත් යාච්ඤා කරන්නට ඉගැන්නුව මැනවැ"යි කිවේ ය.
>
> (ලූක් 11:1)

ඒ අනුව ජේසුස් වහන්සේ මෙම යාච්ඤාව උගන්වා ඇත්තේ උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ ඉල්ලීම අනුව ය. මෙම යාච්ඤාව ලූක් තුමා හා මතෙව් තුමා තම ශුභාරංචිවල වාර්තා කරයි (ලූක් 11:2-4, මතෙව් 6:8-13).

ශුද්ධ වූ මතෙව් තුමා එය වාර්තා කරන්නේ මෙසේ ය:

> ඔබ ඉල්ලන්ටත් පෙර ඔබේ වුවමනා කවරේ ද යි පියාණන් වහන්සේ දන්නා සේක. එහෙයින් මෙසේ යාච්ඤා කරන්න:
> ස්වර්ගයෙහි වැඩ වසන අපගේ පියාණෙනී,
> ඔබ වහන්සේගේ නාමයට ගෞරව වේවා!
> ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා!
> ඔබ වහන්සේගේ කැමැත්ත ඉටු වේවා!
> ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද එසේ ම වේවා!
> අපගේ දවස්පතා ආහාරය අද අපට දුන මැනව.
> අපට වරද කළ අයට අප කමා කළාක් මෙන්
> අපේ වරදට අපට කමා වුව මැනව.
> අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප මිදුව මැනව.
>
> (මතෙව් 6:8-13)

මෙම යාච්ඤාවේ පළමු පදය නම්; "**ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනී**" යන්න යි. එහි අරුත කතෝලික සභා ඉගැන්වීම්වලට අනුව විමසා බලමු:

මනුෂ්‍යත්වය ගත් දේව පුත්‍රයාණන් විසින් අපට පියාණන් වහන්සේ ව එළිදරව් කර ඇත. ප්‍රසාද ස්නාපනය තුළින් දෙවියන් වහන්සේගේ දරුවන් වීම නිසා දෙවියන් වහන්සේට "අපගේ පියාණනී" කියා ඇමතීමට අපට හැකියාව ලැබී ඇත. තව ද "ස්වර්ගයේ වැඩ සිටින" යන වචන උච්චාරණය කිරීමේ දී ස්ථානයක නොව ධර්මිෂ්ඨයන්ගේ හදවත් තුළ දෙවියන් වහන්සේගේ මහිමාන්විත වැඩ සිටීම අදහස් කරයි.

(කතෝලික සභා ධර්මෝපදේශය 2798, 2802)

මෙම යාච්ඤාවෙහි ප්‍රශංසාත්මක පැතුම් 3ක් හා ආධ්‍යාත්මික හා ශාරීරික අවශ්‍යතා පදනම් කරගත් ඉල්ලීම් 4ක් ඇත. එම පැතුම්වල හා ඉල්ලීම්වල අර්ථ මෙසේ ය:

1. **ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා!**

   දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට ගෞරව අත්වන්නේ අප යහපත් ව දිවි ගෙවන විට ය. එබැවින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසාවට ලක්වන අයුරින් දිවි ගෙවිය යුතු වන්නේ ය.

2. **ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා!**

   ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයට මෙය සම්බන්ධ ය. දේව රාජ්‍යයේ පරිසමාප්තිය පතා අපි යාච්ඤා කරමු.

3. **ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ද ඉටු වේවා!**

   ගැලවීමේ සැලැස්ම මෙලොවෙහි පූර්ණත්වයට පත් කිරීම සඳහා අපගේ කැමැත්ත ක්‍රිස්තුන් වහන්සේගේ කැමැත්ත හා එක් කිරීම අපගේ යුතුකම වන්නේ ය.

4. **අපගේ එදිනෙදා භෝජනය අද අපට දනය කළ මැනව.**

   භෝජනය යන්නෙන් මෙලොව ජීවිතයට අවශ්‍ය ආහාර මෙන් ම ආධ්‍යාත්මික ආහාරය වන
   1. දෙවියන් වහන්සේගේ වචනය හා
   2. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය නම් වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අදහස් කරයි.
      i. දිව්‍ය සංරක්ෂණය මත යැපෙමින් අපගේ එදිනෙදා භෝජනයත්
      ii. දේව වචනයෙන් පෝෂණයත්
      iii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගෙන් පෝෂණයත් පතමින් මෙම ඉල්ලීම තුළින් යදිමු.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

5. **අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව.**

ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශය හා උපකාරය මගින් අපගේ සතුරන්ට සමාව දී ඇතොත් පමණක් අපට ද සමාව දෙන ලෙස දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරමු.

6. **පාප අවස්ථාවන්ට හසු වීමට අපට ඉඩ නොදී**

1. පාපයට පෙළෙඹෙන්නා වූ මාර්ගයන් නොපැමිණෙන ලෙසත්
2. පාපයන්ට පොළඹවන්නා වූ අවස්ථා හඳුනා ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ ව ලබා දෙන ලෙසත්
3. සුපරික්ෂාකාරී බවේ වරප්‍රසාද හා උට්ඨාන වීර්ය ලබා දෙන ලෙසත් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිමු.

7. **අයහපතින් අප මුදා ගත මැනව**

සාතන් පරාජය කොට ක්‍රිස්තුන් වහන්සේ අයිතිකර ගැන්මට වරම් දෙන ලෙස දෙවියන් වහන්සේට යාච්ඤා කරමු.

"ආමෙන්" යනු යාච්ඤාවෙන් ඉල්ලූ දෑ නොවැරදී ම ලැබෙන බවට විශ්වාස කරමින් කරන විශ්වාසයේ ප්‍රකාශයකි. මෙම යාච්ඤාව මතෙව් ශුභාරංචියේ ම සාරාංශය යි. පරමණ්ඩල යාච්ඤාවේ අඩංගු නැති කිසිවක් ශුද්ධ ලියවිල්ලේ හමු නොවේ. අපට අවශ්‍ය දේ ඉල්ලීමට පමණක් නොව ඉල්ලන දේ කෙරෙහි ආශා වීමට ද උගන්වන නිසා එම යාච්ඤාව පරිපූර්ණ යාච්ඤාවකි.

ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කළ යුතු ආකාරය ශුද්ධ වූ සභා මාතාව අපට උගන්වන්නී යඃ

අප අයදින සියල්ල අපට නොවැරදි ම ලැබෙන බවට විශ්වාස කරමින් බැහැපත් ව හා සතුටින් පරමණ්ඩල යැදුම යාච්ඤා කළ යුතු ය.
(කතෝලික සභා ධර්මෝපදේශය 2797)



22.2 රූපය - ස්වාමිවාක් ආරාධනාව කීම

මෙම යැදුම උච්චාරණයේ දී අප දෑත් දෙපසට විහිදු දෙවියන් වහන්සේට යාච්ඤා කරමු. එම ඉරියව්ව පවත්වා ගනිමින් යාච්ඤා කිරීමට මෙම යැදුමේ දී අපට ආරාධනා කරයි. මන්ද යාච්ඤාවේ මූලිකාංගයක් වන්නේ නිවැරදි ඉරියව්වෙන් දෙවියන් වහන්සේ ව ඇමතීම යි.

## ස්වාමිවාක් ආරාධනාවේ ව්‍යුහය

- ⋆ ප්‍රශංසාව - ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනී, ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා.
- ⋆ වන්දනාව - ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා. ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙළොවෙහි ද ඉටු වේවා
- ⋆ ඉල්ලීම - අපගේ එදිනෙදා භෝජනය අද අපට දනය කළ මැනව.
- ⋆ කමාව අයැදීම - අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද අපට කමා කළ මැනව.
- ⋆ දේව ආරක්ෂාවට නතු වීම - පාප අවස්ථාවන්ට හසු වීමට අපට ඉඩ නොදී අයහපතින් අප මුදා ගත මැනව.

ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීමට පෙර අපට වරද කළ, දඬුවම් කළ පාඩු කළ හා අපහාස කළ සැමට සමාව දිය යුතු ය. ඉල්ලන දේ ලැබෙන බවට විශ්වාස කරමින් මෙම යැදුම යාච්ඤා කර මෙම යැදුමේ බලමහිමය අත්දකිමු.

**ක්‍රියාකාරකම**

1. දේව කැමැත්ත ඉටු කිරීමට ඔබ කටයුතු කළ අවස්ථා **තුනක්** ලියන්න.
2. "අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව" යන්න ඔබ අනුකරණය කළ අවස්ථා **තුනක්** ලියන්න.



**ජීවිතයට බිඳක්**

***දිනකට තුන් වරක්වත් ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කරන්න. එහි බල මහිමය අත්දකින්න.***